# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2020 ජනවාරි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2020 ජනවාරි මාසයේ ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය (Headline Inflation) 7.6%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. පසුගිය දෙසැම්බර් මාසයේ මතුපිට උද්ධමනය 6.2%ක් ලෙස වාර්තා විය. 2020 ජනවාරි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 6.0%ක හා ආහාර නොවන කාණ්ඩයේ 1.7%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2018 නොවැම්බර් මාසයේ 0.4% ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය -2.1%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.5%ක් විය. 2019 ජනවාරි මාසයට සාපේක්ෂව 2020 ජනවාරි මාසයේ ආහාර කාණ්ඩයේ ප්‍රතිශතය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ එළවළු, සහල්, රතුළූණු, කිරිපිටි සහ ලොකුළූණු යන ආහාර ද්‍රව්‍යවල පැවති ඉහළ මිල මට්ටම් ය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2019 දෙසැම්බර් මාසයේ 135.0ක් වූ දර්ශකාංකය 2020 ජනවාරි මාසයේ 137.0ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2020 ජනවාරි මාසයේ දර්ශකාංකය 2.0ක වැඩිවීමක් එනම් 1.5ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 1.14% කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.36%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට එළවළු, පොල්, රතුළූණු, අළුත් මාළු, පොල්තෙල්, පැපොල්, මිරිස් කුඩු, අමු මිරිස්, මයිසූර් පරිප්පු, මඤ්ඤොක්කා සහ අඹ යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් ලොකුළූණු, දෙහි, අර්තාපල්, සහල් සහ කිරිපිටි යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා විය.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2020 ජනවාරි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (නිවාස කුළිය), 'අධ්‍යාපන' (අතිරේක පංති ගාස්තු), 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (බුලත්), 'විවිධ භාණ්ඩ හා සේවා', 'ආපනශාලා සහ හෝටල්', 'සෞඛ්‍ය' (පෞද්ගලික වෛද්‍ය සේවා ගාස්තු), 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'රෙදිපිළි හා පාවහන්' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම බලපා ඇත. තවද 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' කාණ්ඩයේ සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. කෙසේ වෙතත් පසුගිය මාසය හා සංසන්දනය කළවිට 'ප්‍රවාහන' කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිල සුළු අඩුවීමක් වාර්තා වී ඇත. එසේම පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'සන්නිවේදන' කාණ්ඩයේ මිල දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යාමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2019 දෙසැම්බර් මාසයේ 5.2% සිට 2020 ජනවාරි මාසයේ 3.9% දක්වා අඩුවීමක් වාර්තා විය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) |
| **2019** | ජන. | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 |
| | පෙබ. | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 |
| | අප්‍රේල් | 127.3 | 132.6 | 0.7 | 0.6 | 3.6 | 6.3 |
| | මැයි | 128.7 | 133.0 | 1.1 | 0.3 | 3.5 | 6.3 |
| | ජුනි | 129.2 | 133.0 | 0.4 | 0.0 | 2.1 | 6.1 |
| | ජූලි | 129.4 | 133.4 | 0.2 | 0.3 | 2.2 | 6.1 |
| | අගෝ. | 129.7 | 133.7 | 0.2 | 0.2 | 3.4 | 5.9 |
| | සැප්. | 130.6 | 134.0 | 0.7 | 0.2 | 5.0 | 5.6 |
| | ඔක්. | 131.9 | 134.4 | 1.0 | 0.3 | 5.6 | 5.6 |
| | නොවැ. | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 |
| | දෙසැ. | 135.0 | 134.2 | 1.6 | -0.3 | 6.2 | 5.2 |
| **2020** | ජන. | 137.0 | 135.3 | 1.5 | 0.8 | 7.6 | 3.9 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව